ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2012 දෙසැම්බර් 12 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය - 2012 දෙසැම්බර්

වසරේ මුල් කාලයේදී මහ බැංකුව සහ රජය විසින් ඉහළ ණය ප්‍රසාරණය සහ ඉහළ ආනයන ඉල්ලුම සීමා කිරීමට යොදා ගන්නා ලද ශක්තිමත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග 2011 අවසාන කාලයේ සිට ආර්ථිකයේ ඇති වෙමින් පැවති අසමතුලිතතාවන් මැඩපැවැත්වීමට උපකාරී විය. මුදල් ප්‍රසාරණය සීමා කිරීමට, අනාගතයේ දී ඉල්ලුම් පීඩනයන් ඇති වීම වැළැක්වීමට සහ වෙළෙඳ හිඟය අඩුවීමෙන් විදේශ අංශය මත වූ පීඩනය මන්දනය කිරීමට මෙම ක්‍රියා මාර්ග සැලසුම් කරන ලදී. මේ සමගම සමස්ත ස්ථායිකරණ ප්‍රතිපත්ති සමූහයෙහි කොටසක් වූ පරිපාලිත මිල ගණන් කිහිපයක්ම ඉහළ දැමීම හේතුවෙන් මතුපිට උද්ධමනයෙහි ඉහළ යාමක් අපේක්ෂා කරන ලදී. මෙම ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් වශයෙන් ආර්ථික ක්‍රියාකාරිත්වය යම්දුරකට පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කරන ලද අතර, මෙය වසර තුළදී ආර්ථික වර්ධනය සඳහා පුරෝකථනයන් සියයට 6.8 දක්වා පහතට සංශෝධනය කිරීම තුළින් පිළිබිඹු විය.

මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හඳුන්වාදීමෙන් පසු කාලසීමාව තුළදී මුදල් සැපයුමෙහි අඩුවීමක් දක්නට ලැබුණු අතර, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණයෙහි අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2012 අප්‍රේල් මාසයේදී වාර්තා කළ ඉහළම වර්ධනය වූ සියයට 22.9 සිට 2012 ඔක්තෝබර් මාසයේදී සියයට 18.2 ක් දක්වා අඩු විය. වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2012 මාර්තු මාසයට පෙර දක්නට ලැබුණු සියයට 35 ඉක්ම වූ ඉහළ අගයක සිට ඔක්තෝබර් මාසය වනවිට සියයට 23.5 ක් දක්වා අඛණ්ඩව පහත වැටුණි. මෙම ණය වර්ධනය තවදුරටත් අඩු වී 2012 අවසානයේදී සියයට 19 ක් පමණ වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, වටිනාකම් වශයෙන් ගත් කළ, ආනයන වියදම පහත වැටීම අපනයන ආදායමෙහි අඩුවීමට වඩා විශාල වූ අතර, එය වෙළෙඳ ගිණුමේ සමුච්චිත හිඟය අඛණ්ඩව දෙවැනි මාසය සඳහාත් අඩු වෙමින් සියයට 1.0 ක ප්‍රතිශතයකින් පහත වැටීමට හේතු වූ අතර, වත්මන් නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය තුළ මෙම ප්‍රවණතාව තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථිකයේ විවිධ අංශයන්හි ප්‍රවණතාවන් ඒ හා සබැඳි පුරෝකථනයන්ට සාපේක්ෂව නිරීක්ෂණය කරමින් සිටී. පවත්නා තොරතුරු අනුව, මහ බැංකුව විසින් ණය සඳහා පැනවූ ඉහළ සීමාව සහ දැනට පවතින ණය වර්ධනය අතර සැලකිය යුතු පරතරයක් ඇති වී තිබෙන බවත්, එය ණය උපයෝජනයේ මන්දගාමීත්වය පිළිබිඹු කරන්නක් බවත් පෙනී ගොස් ඇත. එමෙන්ම ගෝලීය ආර්ථිකයේ අවිනිශ්චිතතාව හා අයහපත් කාලගුණ තත්ත්වයන්හි බලපෑම නිසා ආර්ථික කටයුතු අඩාලවීමෙන් 2012 දී ආර්ථික වර්ධනය මත පීඩනයක් එල්ලවීම ද සිදුව ඇත.

මේ අතර, කොළඹ පාරිභෝගික මිල දර්ශකයට (CCPI) අනුව වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය පෙර මාසයේ පැවති සියයට 8.9 සිට 2012 නොවැම්බර් මස දී සියයට 9.5 දක්වා ඉහළ ගොස් ඇත. අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා තෙවන කාර්තුවේ විශේෂයෙන්ම නැවුම් ආහාර වර්ග ඇතුළුව ඉහළ ගිය මිල ගණන් සහ පරිපාලිත මිල ගණන් ඉහළ යාමත්, මෑතකදී සිදුකළ බදු වෙනස්වීම් හේතුවෙන් මේ වසරේ දෙවන භාගයේදී උද්ධමනය සියයට 9 ට ආසන්න අගයක පැවතුණි. ඉදිරියේදී දේශීය සමාහාර ඉල්ලුම මධ්‍යස්ථ තත්ත්වයකට සීමාකර ඇති බවට මුදල් මණ්ඩලය සෑහීමට පත් වුවද, සැපයුම් අංශයේ සාධකයන් හේතුවෙන් ආසන්න මාස කිහිපය තුළ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මතුපිට උද්ධමනය තරමක ඉහළ අගයන්හි පැවතිය හැක. කෙසේ වුවද, වර්තමාන පුරෝකථන අනුව, මේ වසර මුලදී හඳුන්වා දුන් දැඩි ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති හේතුවෙන් 2013 දෙවන කාර්තුව වනවිට උද්ධමනය මධ්‍යස්ථ මට්ටමකට පැමිණ ඉන් අනතුරුව ස්ථායීව පවතිනු ඇත.

ඉහත සඳහන් කරන ලද ප්‍රවණතා හා පෙරදැක්ම ඇගයුම් කරමින් 2013 දෙවන කාර්තුවේ පමණ සිට උද්ධමනයෙහි අපේක්ෂිත අඩුවීම සහ 2013 සහ ඉදිරියේදී ආර්ථිකයේ වර්ධන විභවතාව සපුරා ගැනීම සඳහා ආර්ථිකයට පහසුකම් සැලසීමේ අවශ්‍යතාව සලකා බලා 2012 දෙසැම්බර් 11 පවත්වන ලද මුදල් මණ්ඩල රැස්වීමේදී වර්තමාන සාර්වාර්ථික සමතුලිතය පවත්වා ගනිමින් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීමට අවකාශයක් ඇති බව මුදල් මණ්ඩලයේ මතය විය. මේ අනුව, වෙළෙඳපොළ පොලී අනුපාතිකයන්හි අඩුවීමක් ඇති කිරීම සඳහා බැංකු විසින් ලබාදෙන රුපියල් ණය මත පනවා තිබූ සීමාව 2012 අග වන විට අවසන් වීමට ඉඩ සලසමින් මහ බැංකුවෙහි ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 25 කින් අඩු කිරීමට මුදල් මණ්ඩලය තීරණය කරන ලදී. මේ අනුව, වහාම බලපැවැත්වෙන පරිදි මහ බැංකුවෙහි ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය හා ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙලින් සියයට 7.50 ක් සහ සියයට 9.50 ත් වනු ඇත. මේ අතරම 2012 සඳහා පනවන ලද බැංකු ණය වර්ධනය මත වූ ඉහළ සීමාව තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ඇති බවත් නුදුරු අනාගතයේදී මෙවන් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයක් අවශ්‍ය නොවන බවත්, මුදල් මණ්ඩලයේ මතය විය.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය සිදු කරනු ලබන දිනය යථා කාලයේදී ප්‍රකාශයට පත් කරනු ඇත.